ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණතත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වත්කම් අපහරණය කිරීම මගින් අවස්ථා 02 කදී උපයාගෙන තිබූ එකතුව වූ රු.363,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් ලෙස හඳුනානොගෙන මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි.	ඉදිරියේදී එම ආදායම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ඇතුලත් කරන බව.	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට වැඩපිළිවෙළක් යෙදිය යුතුය.
(ii)	භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය SA 10 ට අනුව සමාලෝචිත වර්ෂයට ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,688,907,924 ක් වුවද ACA-2(iv) වැඩසටහන අනුව වියදම් මූල්‍යකරණ සාරාංශයෙහි දේශීය අරමුදල් වලින් ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,681,972,924 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 6,935,000 ක වෙනසක් නිරීක්ෂණය විය.	එකඟවෙමි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයෙහි ශුද්ධ ප්‍රතිපාදනය නිවැරදි අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ශේෂයන් අතර වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය SA-50 අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ වර්ෂය තුළ මුළු හර කිරීම්වල එකතුව රු.175,586,090 ක් වුවද, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද, දෙපාර්තමේන්තු පාලන	මෙම වෙනස නිරවුල් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර ඇති බව.	ශේෂයන් අතර වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

ගිණුම් සාරාංශය (ආකෘතිය – 05) අනුව එම ශේෂය රු.176,020,858 ක් ලෙස දැක්වීමෙන් රු.434,768 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඇ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මහියංගනය ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල රු.6,965,273 ක් වූ බිල්පත් වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කලයුතු වුවත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ගොඩනැගිලි ගිණුම යටතේ ගිණුම්ගත කර තිබීමෙන් ගොඩනැගිලි වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමට ඇතුළත් විය යුතු අතර අතපසුවීමකින් ගොඩනැගිලි ගිණුමට ඇතුලත් වී ඇති බව.	නිසි පරිදි ගනුදෙනු ගිණුම් තැබීම සිදු වන බව තහවුරු වන අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කළ යුතුය.
(ii)	මහියංගණය ප්‍රාදේශිය ලේකම් නිල නිවාසය ඉදි කිරීමට අදාළ වැඩ අවසන් තහවුරුව, ඉංජිනේරු සමාගම විසින් 2020 ජුලි මස 30 වන දින දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබූ අතර, මහියංගණය ප්‍රාදේශිය ලේකම්වරයා 2020 සැප්තැම්බර් 18 වන දින නිල නිවාසයේ පදිංචි වී තිබුණි. ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයයන් අවසන්ව තිබියදී, විගණන දිනය වූ 2025 මාර්තු 28 දින වන විටත් නිල නිවාසයේ වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමෙහි රු.8,046,918 ක් ලෙස දක්වා තිබීමෙන් ගොඩනැගිලි ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදි මෙම වටිනාකම ගොඩනැගිලි ගිණුමට ඇතුලත් කරන බව.	අදාළ ශේෂය වත්කම් ගිණුමට මාරු කිරීමටත්, ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට වැඩපිළිවෙළක් යෙදීමටත් පියවර ගත යුතුය.
(iii)	ඌවපරණගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයේ පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණු අතර එය සමාලෝචිත වර්ෂය තුළදී රු.327,000 කට අපහරණය කර තිබුණි.	එකඟවෙමි. මෙම කැබ්රථයේ වටිනාකම හඳුනාගෙන අදාළ ලේඛන වලට ඇතුළත් කරන බව.	වත්කම් නිසිපරිදි හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දිය යුතුය.

(ඇ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට නිරවුල් නොකල අග්‍රිම ශේෂය රු. 68,933,164 ක් විය.	එකඟවෙමි. 2024 වර්ෂයේ පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරි කටයුතු සඳහා නිරත වුණු නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා ලබාදුන් අත්තිකාරම් මුදල් රු.9,604,064 ක් ද ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.7,850 ක මුදලක් සිගාස් දත්ත පද්ධතිය නිවැරදි කිරීම් හා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආපසු හරවා එවූ රු.59,321,250 ක මුදල සිගාස් පද්ධතියට වැරදි ලෙස ගිණුම්ගත වී ඇති බව.	අග්‍රිම ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතුය.

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**ස්ථාවර වත්කම් ලේඛනය**		
	2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සීගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛන පිලියෙල කර යාවත්කාලීන කර නොතිබුණි.	යාවත්කාලීන කර ඇති බව.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව ස්ථාවර වත්කම් ලේඛණය පිළියෙල කල යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	2025 වර්ෂයේ සිට මු.රෙ 447 ප්‍රකාරව කලාපයන්ට අයත් වැය ලෙජරයන් යාවත්කාලීන කරන බව.	මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව 138 වැනි පොදු පෝරමයේ දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

(iii) **හානි පිළිබඳ ලේඛනය**

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ වාර්තා කිරීමට, අත්තිකාරම් ගිණුම්වල හානි සහ වෙනත් හානි පිළිබඳ විස්තර පවත්වාගෙන යාම සඳහා වෙන වෙනම පොත් පවත්වාගෙන ගෙන ගොස් නොතිබුණි.	ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව.	මුදල් රෙගුලාසි 110 ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛන පවත්වා ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව පිළිබඳ නිසි සැලකිල්ලක් යොමු කර නොතිබුණු හෙයින් වැය විෂයන් 3 ක් සම්බන්ධයෙන් සලසා තිබූ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 19 ක සිට සියයට 160 අතර ප්‍රතිපාදන ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර තිබුණු බව නිරීක්ෂණය විය.	අදාළ වැය විෂයයන් යටතේ වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මාරු කිරීමට සිදු වූ බව.	වඩාත් විධිමත් හා තාර්කික ක්‍රමවේද මත ඉදිරි වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කළ යුතු අතර වෙන්කළ ප්‍රතිපාදන පූර්ණ උපයෝජනය සඳහා විධිමත් පරිදි කටයුතු කළ යුතුය.
(ආ)	වැය විෂයන් 11කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා සලසා දී තිබූ රු.97,738,296 ක ප්‍රතිපාදනවලින් රු.23,498,776 ක් ඉතිරිව තිබූ අතර, එය එක් එක් වැය විෂය වෙනුවෙන් ලද ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 11 ක සිට සියයට 100 දක්වා පරාසයක විහිදී තිබුණ බව නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ ඇති වූ විවිධ ප්‍රායෝගික තත්වයන් මත ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	- එම -

(ඇ)	සමාලෝචිත වර්ෂයට අදාළව පුනරාවර්ථන වැය විෂයන් 12ක මුළු වියදමින් සියයට 11 ත් සියයට 100 ත් දක්වා ප්‍රමාණයක් හා මූලධන වැය විෂයන් 06 ක මුළු වියදමින් සියයට 39 ත් සියයට 95 ත් දක්වා ප්‍රමාණයක් දෙසැම්බර් මස වැය කර තිබූ බව නිරීක්ෂණය විය.	ව්‍යාපෘති සහ වැඩසටහන් වලින් වැඩි ප්‍රමාණයක් වර්ෂය අග භාගයේදී ක්‍රියාත්මක වූ අතර ඊට අදාල වවුචර්පත් වැඩි ප්‍රමාණයක් දෙසැම්බර් මස ලැබී ඇති බව.	සැලසුම් වලට අනුකූලව වියදම් ක්‍රියාවලිය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට වැඩ පිළිවෙළක් සැකසිය යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොයොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**				
	XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය	3,031,686	ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනමට ලක් වූ හා සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 44 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 01 සිට වසර 20 කට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂයන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.	ණය ශේෂ නිරවුල් කරන ලෙස ඌව පළාත් සභාව වෙත දැනුම් දී ඇතත් නිරවුල් කර නොමැති බව.	කාලීනව ණය අය නොකළ නිළධාරීන් හඳුනාගෙන විධිමත් පරිදි කටයුතු කිරීමටත්, ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ණය ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
	මුදල් රෙගුලාසි 104		(i) අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරිමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ නම් ප්‍රාරම්භක වාර්තාවක් ලබා	එකඟවෙමි. ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කරන ලෙස මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා ඇති අතර අනෙක් අලාභ හානියට අදාළව	වාර්තා පිළියෙල නොකළ නිළධාරින් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව කඩිනමින් පිළියෙල කිරීමත් කළ යුතුය.

		ගැනිමට කටයුතු කල යුතු වුවද හානි හා පාඩු අවස්ථා 02 කදි යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පරික්ෂණ මණ්ඩලය පත්කොට පරික්ෂණ සිදුවෙමින් පවතින බව.	
1,629,690	(ii)	අනතුර සිදු වී දීර්ඝ කාලයක් ගතවූ අලාභ හානි 6ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	අලාභ හානි 2ක් සම්බන්ධයෙන් මු.රෙ 104(4) ප්‍රකාර පරික්ෂණ මණ්ඩල වාර්තාව ලද පසු ඉදිරි කටයුතු කරන බවත් තවත් අලාභ හානි 02 කට අදාළව වගකිව යුතු පාර්ශව වෙත ගෙවීම් කරන ලෙස දන්වා ඇති බවත් එක් අලාභ හානියක් කපා හැරිමට අනුමැතිය ලැබී ඇති බව හා අනෙක් අලාභය සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් උපදෙස් විමසා ඇති බව.	කාලීනව කටයුතු නොකළ නිළධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනිමත්, මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන අනුව අලාභය අදාළ පාර්ශවයන් වෙතින් අයකර ගැනිමට විධිමත් පරිදි කටයුතු කිරීමත් කළ යුතුය .
3,849,333	(iii)	රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථය 2017 ජුලි 29 දින අනතුරට පත්ව තිබුණු රු.6,349,333 ක මුළු අලාභයෙන් රු.2,500,000 ක් රක්ෂණයෙන් ප්‍රතිපූරණය කර තිබුණි. රක්ෂණය මගින් ප්‍රතිපූරණය	මෙම මුදල ගෙවන ලෙස වගකිව යුතු නිලධාරියා වෙත සිහි කැඳවීම් ලිපි යොමුකර ඇතිබව.	විධිමත් පරිදි පරීක්ෂණ පවත්වා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන අනුව අදාල පාර්ශවයන් වෙතින් අලාභය අයකරගත යුතුය.

			නොකල අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.		
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ				
	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය		ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04ක වාහන 05ක් සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරික්ෂාව සිදුකර නොතිබුණි.	ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදු කර වාර්තා කරන මෙන් උපදෙස් ලබා දී ඇති බව.	චක්‍රලේඛයේ විධිවිධාන අනුව වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකල යුතුය.
(ඈ)	**කාර්යපටිපාටික රීති සංග්‍රහයේ රීති 139**	640,796	රීති 139 ප්‍රකාරව ආවරණ අනුමැතිය රහිතව ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ බලන ගණකාධිකාරී වෙත, 2020 ඔක්තෝබර් 09 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වැඩ බැලීමේ වැටුප් ගෙවා තිබුණි.	එකඟවෙමි. අදාල අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර ඇති බව.	කාර්යපටිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර අනුමැතියෙන් තොරව වැටුප් ලබා ගත් නිළධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

3.3 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජුලි 26 දිනැති අංක 2394/56 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 4.2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරණය ප්‍රකාශ කර ඇති කාලසීමව තුල සහ 2024 සැප්තැම්බර් 25 දිනැති අංක 2403 /19 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 4.2 වගන්තිය ප්‍රකාරව මහ මැතිවරණය ප්‍රකාශකර ඇති කාලසීමාව තුල රජයේ ආයතන හරහා දේශපාලන අපේක්ෂකයින් හා පක්ෂ නියෝජනය වන පරිදි ද්‍රව්‍ය හා උපකරණ බෙදාදීම නතර කරන ලෙස දන්වා තිබුණද ප්‍රදේශීය ලේකම් කාර්යාල 07ක	බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩා පහසුකම් නොමැති වීම හේතුවෙන් එම අවස්ථාවේදීම ප්‍රතිලාභීන් වෙත බෙදුබවත්, හපුතලේ හා ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අවස්ථා 03 කදී භාණ්ඩ බෙදාහැරීම් කර ඇති බව.	නීතියට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතුය.

ප්‍රතිලාභීන් 33,232 ක් සඳහා සහල් බෙදා හැරීමේ දෙවන අධියර සහ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක අවස්ථා 47 ක දී රු.5,790,270 ක ද්‍රව්‍ය හා උපකරණ බෙදා දී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 ඔක්තෝබර් 24 දින වන විටත් වැඩසටහන් 02ක් යටතේ ප්‍රතිපාදිත රු.22,433,710 ක් වටිනා ව්‍යාපෘති 28 ක වැඩ ආරම්භ කර නොතිබුණි.	එකඟවෙමි. ව්‍යාපෘති 16ක වැඩ නිමකර ඇති අතර ඇස්තමේන්තු සකස් නොකිරීම, ව්‍යාපෘති සංශෝධනය නොවීම වැනි කරුණු හේතුවෙන් අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට නොහැකි වු බව.	සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු නොකළ නිලධාරින් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.5,944,977 ක් වැයකර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, විගණිත දිනය වූ 2024 සැප්තැම්බර් 09 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භක අවධියේ පසුවන බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති වාර්තාව අනුව සංචාරකයින් ඉලක්ක කරගත් නිෂ්පාදන බිහිකිරීම සහ අපනයන වෙළඳපල ඉලක්ක කරගත් නිෂ්පාදන ඇති කිරීම යන අරමුණු ඉටුකරගෙන නොතිබුණු අතර එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක්ද, 2024 වර්ෂය සඳහා සකස් කර නොතිබුණි. ප්‍රතිලාභීන් සක්‍රීය ලෙස	මේ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	අඛණ්ඩව පසුවිපරම් කර ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට නිලධාරීන් වෙත වගකීම පැවරෙන ආකාරයේ වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කරවා පසු විපරම් කළ යුතුය.

	ව්‍යාපෘතියට දායක නොවීම, අමු ද්‍රව්‍ය සපයා ගැනීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය, පුහුණු අවශ්‍යතාවය හා වෙළඳපල හඳුනා ගැනීම සම්බන්ධයෙන් වූ ගැටළු මත ප්‍රතිලාභීන් ව්‍යාපෘතියෙන් ඉවත් වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් රජය විසින් රු.මිලියන 06 කට ආසන්න මුදලක් වැයකර ඇති මෙම ව්‍යාපෘතියෙන් අයෝජනයට සාපේක්ෂව ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.		
(ආ)	වැඩ කිහිපයක් - ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියාපදිංචි සමිති 03 ක් සඳහා ලබාදී තිබු රු. 494,550 ක් වටිනා උපකරණ අදාළ සමිතියේ සුභසාධනය සඳහා භාවිතයට නොගෙන, පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගෙන ගබඩා කර තිබුණි.	අනාරක්ෂිත බව හේතුවෙන් අදාළ භාණ්ඩ දිලෙන තරු ග්‍රාම සංවර්ධන සමිතියේ භාණ්ඩාගාරිකගේ නිවසේ තබා ඇති බව.	විධිමත් අධීක්ෂණයක් සිදු කිරීමත්, අදාළ උපකරණ ප්‍රශස්ථ ලෙස ප්‍රයෝජනයට ගැනීම තහවුරු වන වැඩපිළිවෙළක් සැකසීමත් කළ යුතුය.

4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නායයාම් හේතුවෙන් ආපදාවන්ට ලක්වූ පවුල් 65 ක් නැවත පදිංචි කිරීමේ කටයුතු හපුතලේ ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 ඔක්තෝබර් මසදී ආරම්භ කර ඇතත් 2024 දෙසැම්බර් දක්වා ඉදිකිරීම් නිමකර නැවත පදිංචි කර නොතිබුණි.	නිවාස ව්‍යාපෘතියට අදාල නිවාස 07ක වහලය සෙවිලි කර අවසන්ව ඇති අතර අනෙකුත් කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින බව.	නායයාමේ අවදානමට ලක් වූ ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය.
(ආ)	ආපදාවන්ට පත් වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ආපදාවට පත්වූ ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත ඌවපරණගම ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් රු.10,475,000 ක් වාරික වශයෙන් ගෙවා තිබුණු අතර නැවත පදිංචි කිරීමේ කටයුතු නිමකර නොතිබුණි. මේ හේතුවෙන් නිරන්තර පසුවිපරම් කිරීමත්, නිසි පරිදි අධීක්ෂණය කිරීමත් සිදුකර නැවත පදිංචි කිරීම් කටයුතු කඩිනමින් නිම කිරීම තුලින් ආපදාවන්ට පත්වූවන් අනාරක්ෂිත බවින් මුදවා ගැනිම කෙරෙහි අවධානය යොමු කල යුතු බව නිරීක්ෂණය විය.	ප්‍රතිලාභීන් 07 දෙනෙකු සඳහා නිවාස හානි වෙනුවෙන් මේ වන විට ගෙවා ඇති මුදලින් 6 දෙනෙකුගේ කටයුතු සාර්ථකව සිදුවෙමින් පවතින අතර දැනට නිශ්කාර්ය ගෙවීමක් ලෙස හඳුනාගත් එක් අයෙකු වෙත ගෙවා ඇති රුපියල් ලක්ෂ 02 ක මුදල නැවත අයකර ගැනීමට හෝ නිවාස ඉදිකිරීම සඳහා ප්‍රතිලාභියා පෙළඹවීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.	නැවත පදිංචි කිරීමේ කටයුතු කාලීනව සිදු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත් නායයාමේ අවදානමට ලක් වූ ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමත් කළ යුතුය.

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඵලදායී ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.1,481,712 ක් වැයකර මිලදී ගෙන තිබුණු රෙදි පින්තාරු කිරීමේ උපකරණවලින් උපකරණ 33 ක් භාවිතයට නොගෙන ඌණ උපයෝජිතව පැවතුණි.	ප්‍රතිලාභී කණ්ඩායම් 05ක් රෙදි මුද්‍රණ කටයුතු වල නිරත වන අතර වතුර පොම්ප වෙනත් සෞභාග්‍යා නිෂ්පාදන වැඩසටහනකට ලබා දිමට කටයුතු කරමින් පවති. ඔවර්ලොක් මැෂින් අවශ්‍ය ප්‍රතිලාභීන් වෙත ලබාදීමට හෝ ජුකී මැෂින් වලට හුවමාරු කර ගැනීමට හඳුනාගැනීම් සිදු කරනු ලබන අතර මෙම වර්ෂය තුල නැවත ප්‍රතිලාභීන් ව්‍යාපෘතිය වෙත යොමු කිරීමට සැලසුම් කරන බව.	ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම හා අධීක්ෂණය භාර නිලධාරීන් විසින් තම කාර්යභාරය නිසි පරිදි ඉටු කරන බව තහවුරු කර ගන්නා වූ වැඩපිළිවෙළක් සැකසීමත්, මෙම ව්‍යාපෘතියේ උපකරණ කාර්යක්ෂමව භාවිතයට ගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

4.5 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.384,575 ක විශ්‍රාම වැටුපක් වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල වාර්ථාව අනුව උරුමක්කරුවන්ගෙන් අයකර ගතයුතු රු.384,575 ක මුදල ගෙවීමට නොහැකිබව ඔවුන් විසින් 2024 මාර්තු 05 වන දින දැනුම් දී තිබුණද, මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන රජයට සිදු වු අලාභය අයකර ගෙන නොතිබුණි.	උරුමක්කරුවන්ගෙන් අයකරගත නොහැකිබව 2024 ඔක්තෝබර් 14 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමෙන්තුව වෙත දන්වා යවා ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා නිලධාරීන්ගේ නොසැලකිල්ල මත වැඩිපුර ගෙවීම් සිදු වී ඇත්නම් ඒ පිළිබඳව කටයුතු කිරීමටත්, විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගනිමින් වැඩිපුර ගෙවීම් වළක්වා ගැනීමට කටයුතු කළ යුතු විමත් වැඩිපුර ගෙවීම් අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී වර්ෂ අටකට පසු ඊට අදාළ හානිය රු.500,000ක් ලෙස 2019 මැයි 15 දින තක්සේරුකර තිබුණු අතර මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාවට අනුව අනතුර සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය 2025 මාර්තු 28 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	මු.රෙ 104 (4) පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ලද විගස වගකිවයුතු පුද්ගලයින්ගෙන් අලාභය අයකරන බව.	හානි තක්සේරු කිරීමට වසර 8 ක කාල පමාවක් සිදු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් කටයුතු කිරීමටත්, වාහන අනතුරට අදාලව තක්සේරු කරන ලද අලාභය වගකිව යුතු පර්ශවයන්ගෙන් අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කිරීමත් කළ යුතුය.

4.6 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම මැයෙන් වූ අංක 24/0645/601/038-01 හා 2024 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2024 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අවශ්‍ය සහල් තොග මිලදී ගැනීම එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉදිරිපත් වන සැපයුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය ලබාදෙමින් සැපයුම්කරුවන් තෝරාගැනීමට උපදෙස් ලබාදී තිබුණි. එම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ලෙස සැපයුම්කරු තෝරාගැනීම හේතුවෙන් සහල් ප්‍රවාහනය සඳහා අතිරේක කිලෝමීටර 10,688 ක් වෙනුවෙන් වැය කර තිබුණු රු.2,215,474 ක ප්‍රවාහන පිරිවැය රජයට සිදුවූ අලාභයක් ලෙස නිරීක්ෂණය විය.	සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමිකරුවන් 371 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනමින් දැනුවත් කළ ද, 21ක් පමණක් ඉදිරිපත් වූයෙන් සහල් සැපයුම ප්‍රමාණවත් නොවූ බැවින්, 38.86% ක් වෙනත් දිස්ත්‍රික්ක වලින් සපයා ගැනීමට සිදු වූ බව.	විධිමත් පරීක්ෂණයක් .පවත්වා රජයට සිදු වී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	අඩු ආදායම්ලාභීන් සඳහා සහල් බෙදාහැරීමේ වැඩසටහනෙහි පළමු අදියර යටතේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 12,970 ක් හඳුනාගෙන ඒ වෙනුවෙන් කිලෝග්‍රෑම් 10 සහල් මලු 12,970 ක් මිලදී ගැනීම සහ ප්‍රවාහනය සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.24,308,650 ක් ගෙවීම් කර තිබුණද භාර ගැනීමේ ලේඛන අනුව සහල් භාර ගැනීමේ නිලධාරීන් විසින් කිලෝග්‍රෑම් 10 මලු 12,700 ක් භාර ගෙන තිබුණි. ඒ අනුව මිලදි ගත් සහල් මලු ප්‍රමාණය සහ භාර ගත් ප්‍රමාණය අතර රු. 502,200 ක වටිනා සහල් මලු 270 ක වෙනසක් පැවතුණි.	කිලෝග්‍රෑම් 10 සහල් මලු 270ක් ලේඛන වලට ඇතුලත් කිරිමට මඟහැරීම හේතුවෙන් සිදු වූ වෙනසක් බව.	- එම -
(ඇ)	රජයේ ඉඩම්වල අයිතිය සුරක්ෂිත කිරීම හා අනවසර අල්ලා ගැනීම් වලක්වා ගැනීම පිණිස ග්‍රාම නිලධාරීන් විසින් වසම තුල පවතින අනවසරයෙන්	මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනවසර අල්ලා ගැනීම් සම්බන්ධව දෙසති වාර්තා ඉදිරිපත් කරන ලෙස	කාලීනව වාර්තා ඉදිරිපත් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, ඉදිරියේදී විධිමත්

	අල්ලා ගැනීම් සම්බන්ධයෙන් ආ.ඒ.ආ.60 ආකෘති පත්‍ර මගින් සෑම දෙසතියකට වරක්ම ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කලයුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ග්‍රාම නිලධාරී වසම් 08 ක දෙසති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	සියළුම ග්‍රාම නිලධාරින් ලිඛිතව දැනුවත් කර ඇති බව.	පරිදි දෙසති වාර්තා ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කට අයත් සමෘද්ධි බැංකු 47 ක් විසින් ප්‍රතිලාභීන් 4,241 කට ලබාදෙන ලද ණය මුදලින් රු.226,947,012 ක් වූ බොල්ණය 2024 දෙසැම්බර් 31 වන විටද අයකර ගෙන නොතිබුණි.	අයවෙමින් පවතින අතර නොගෙවන ප්‍රතිලාභීන්ගේ බොල් ණය අයකර ගැනිමට නිලධාරීන් දැනුවත් කර ඇති බව.	හිඟ ණය මුදල් කාලීනව අය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධමත් පියවර ගැනීමටත්, ගිවිසුම් අනුව කටයුතු කර අදාළ හිඟ ණය මුදල් කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 79 ක් පැවති අතර අතිරික්ත සංඛ්‍යාව 234 ක් විය.	පුරප්පාඩු පවතින තනතුරු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර අතිරික්ත කාර්යය මණ්ඩලය රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත සිදුවූ බඳවා ගැනිම් හේතුවෙන් සිදු වූවක් බව.	කාර්ය මණ්ඩල අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කර පුරප්පාඩු හා අතිරික්තතාවයකින් තොරව කාර්ය මණ්ඩලය ප්‍රශස්ථ මට්ටමෙන් පවත්වාගෙන යාමට කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය.